වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

අංක 09

පිලිප් ගුණවර්ධන මාවත

කොළඹ 07

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය :- 219

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

1960 දශකයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව 1970 දී අරඹන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට ගෙන 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය.

නිරෝගිමත් ක්‍රියාශීලි සමාජයක් උදෙසා ක්‍රීඩා සංස්කෘතියක් සහ විනයගරුක බව තුළින් ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහි කරමින් ක්‍රීඩාවේ උන්නතිය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව දැනට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

" ජාතික අභිමානය උදෙසා ජවසම්පන්න ශ්‍රී ලාංකිකයෙක් . "

- **මෙහෙවර**

සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක්, තරඟකාරී ක්‍රීඩාවන්හි ජයග්‍රාහී මානසිකත්වයක් නිර්මාණය, සමෘද්ධිමත් ක්‍රීඩා සංස්කෘතියක් ඇති කිරීම තුළින් ක්‍රීඩාවේ විශිෂ්ඨත්වය ලඟා කර ගැනීම.

- **අරමුණු**

1. **සමාජයේ සියළුම අංශවලට ක්‍රීඩාවට අවකාශය ලබාදීම තුළින් ශාරීරික සුවතාවය, ඵලදායීතාවය හා තෘප්තිය වර්ධනය කිරීම.**
2. **ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ජාතික හා ජාත්‍යාන්තර මට්ටමින් ජයග්‍රහණ අත්කර ගැනීම.**
3. **ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යාන්තර තලයට ගෙනයා හැකි අන්තර්ජාතික මට්ටමේ දැනුමැති දේශීය පුහුණුකරුවන් බිහි කිරීම.**
4. **ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යාන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීම.**

1.3. සංවිධාන සටහන



Department of Sports Development
Director General
Additional Director General
Director (Planning)
Director (Admin)
Chief Internal Auditor
Chief Accountant
Director (Sports)
Director (Engineer)
Asst. Director (Admin)
Accountant
Asst. Director (Sports)
Deputy Director (Sports)
Engineer
Derector procurement
Administrative Officer
Headquarters Sports Officer
ICT Officer
Translator
DO
D. O.
Planning & Programme Asst.
Human Resource Development Asst.
Curator
Sports Coach
Technical Officer
MSO
Sport Officer
Asst. ICT Officer
M.S.O.
Warden
Asst. Warden
Ground Clerk
Exercise Assistant
Driving Service
Cook
O.E.S.
Asst. Cook
Ground Assistant
Life Guard

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
- පාලන අංශය
- ගිණුම් අංශය
- සැලසුම් අංශය
- සංවර්ධන අංශය
- ක්‍රීඩා අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ප්‍රසම්පාදන අංශය

1.5. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත අරමුදල්

රජයේ ඒකාබද්ධ අරමුදල

1.6. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අදාළ නොවේ

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය

අනු අංකය	වැය ශීර්ෂය	විස්තරය	2024 ප්‍රතිපාදන (රු.මිලි)			2024.12.31 දිනට මූල්‍ය වියදම (රු.මිලි.)			මූල්‍ය ප්‍රගතිය (%)	සමුච්චිත භෞතික ප්‍රගතිය (%)
			මුල් ප්‍රතිපාදන	අතිරේක ප්‍රතිපාදන	අතිරේක ප්‍රතිපාදන සහ මාරු කිරීම් මත ශුද්ධ ප්‍රතිපාදන	ක්‍රී.සං.දෙ	දි.ලේ/ අමාත්‍යාංශය	එකතුව		
1	219-2-2-17 – 2001	පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම.	777.000	-	777.000	737.773	26.191	763.964	98%	94.30%
2	219-2-2-17-2104-31	දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා සංකීර්ණය	100.000	-	100.000	-	-	-	0%	0.3%
3	219-2-2-17-2104-46	බර්නාඩ් අළුවිහාරේ ක්‍රීඩාංගණය - මාතලේ, මීටර් 400 ධාවන පථය	60.000	-	60.000	-	48.543	48.543	81%	100%
4	219-02-02-17-2104-66	ශාන්ත ජෝශප් වාස් විද්‍යාලයේ ක්‍රීඩා සංකීර්ණය	-	100.000	100.000	98.650	-	98.650	99%	85%
5	219-02-2-32-2104	ටොරින්ටන් හොකී ක්‍රීඩාංගනය-(Astro Polytan Pitch & Polytan Supplier)	101.500	-	101.500	70.306	26.191	96.497	97%	100%
6		ටොරින්ටන් හොකී ක්‍රීඩාංගනය-(Land Preparation)	-	57.696	57.696	-	57.696	57.696		

අනු අංකය	වැය ශීර්ෂය	විස්තරය	2024 ප්‍රතිපාදන (රු.මිලි)			2024.12.31 දිනට මූල්‍ය වියදම (රු.මිලි.)			මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
			මුල් ප්‍රතිපාදන	මු.රෙ 66 මාරු කිරීම්	අතිරේක ප්‍රතිපාදන සහ මාරු කිරීම් මත ශුද්ධ ප්‍රතිපාදන	ක්‍රී.සං.දෙ	දි.ලේ/ අමාත්‍යාංශය	එකතුව		
7	219-2-2-0-1409	**දක්ෂතා සංවර්ධනය**								
	219- 02- 02 – 1508 – 24	ක්‍රීඩකයන්ට ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ සඳහා පහසුකම් සැලසීම	100.000	-	100.000	94.215	-	94.215	94%	100%
	219- 02- 02 – 1508 – 25	දෙවන ස්ථරයේ ක්‍රීඩක සංචිතය - ක්‍රීඩා ශක්ති	100.000	(6.000)	94.000	68.797	-	68.797	73%	90%
	219- 02- 02 – 1508 – 26	ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලි	300.000	47.700	347.700	346.954	-	346.954	100%	100%
	219- 02- 02 – 1508 – 27	ජාතික ක්‍රීඩා තරගාවලිය	180.000	42.000	222.000	195.304	21.873	217.177	98%	100%
	219- 02- 02 – 1508 – 28	උසස් දක්ෂතා සහිත ක්‍රීඩක සංචිතය සඳහා පහසුකම් සැලසීම	100.000	(47.700)	52.300	51.452	-	51.452	98%	90%
	219- 02- 02 –1203 – 27	ජාතික සංචිත සඳහා පෝෂණය	277.000	(75.000)	202.000	181.969	-	181.969	96%	96%

2.1.1. විශේෂ ජයග්‍රහණ

අනු අංකය	ක්‍රීඩා තරඟාවලියේ නම	ක්‍රීඩක/ ක්‍රීඩිකාවගේ නම	ක්‍රීඩාව	ඉසව්ව	පැවැත් වූ රට	දක්ෂතාවය (රන්, රිදී, ලෝකඩ, ශූරතාවය, අනු ශූරතාවය)
01	පැරාලිම්පික් තරඟාවලිය-2024	සමිත දුලාන්	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	F 44 හෙල්ල විසිකිරීම	ප්‍රංශය	රිදී පදක්කම
02	2024 පැරාලිම්පික් මළල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලිය	සමිත දුලාන්	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	F 44 හෙල්ල විසිකිරීම **(ලෝක වාර්තාවක් සමඟින්)**	ජපානය	රන් පදක්කම
03	2024 පැරාලිම්පික් මළල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලිය	එම්.ජී.නුවන් ඉන්දික	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	මීටර් 100	ජපානය	ලෝකඩ පදක්කම
04	2024 පැරාලිම්පික් මළල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලිය	පාලිත බණ්ඩාර	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	යගුලිය විසිකිරීම	ජපානය	ලෝකඩ පදක්කම
05	පැරාලිම්පික් ටේබල් ටෙනිස් තරඟාවලිය	පී.ඩී.එස්.දිනේෂ් දේශප්‍රිය	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	ටේබල් ටෙනිස්	ජෝර්දානය	රන් පදක්කම
06	2024 ග්‍රෑන්ඩ් පික්ස් ලෝක පැරා මලල ක්‍රීඩා තරඟාවලිය	සමිත දුලාන් ධනනි ධනංජනා	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	F 44 හෙල්ල විසිකිරීම මීටර් 100	මොරොක්කෝව	රන් පදක්කම් 02
		ධනනි ධනංජනා ප්‍රදීප් සෝමසිරි අනිල් ප්‍රසන්න කුමුදු ප්‍රියංකා බුද්ධික ඉන්ද්‍රපාල	මේස පන්දු (පැරාලිම්පික්)	දුර පැනීම මීටර් 1500 මීටර් 100 දුර පැනීම මීටර් 100	මොරොක්කෝව	රිදී පදක්කම් 05
07	ග්‍රෑන්ඩ් පික්ස් පැරාලිම්පික් මළල ක්‍රීඩා තරඟාවලිය	මධුරංග සුහසිංහ අනිල් ජයලත්	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	මීටර් 400	ඩුබායි	රන් පදක්කම් 02
		නුවන් ඉන්දික	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	මීටර් 100	ඩුබායි	රිදී පදක්කම
		ප්‍රදීප් සෝමසිරි	මළල ක්‍රීඩා (පැරාලිම්පික්)	මීටර් 1500	ඩුබායි	ලෝකඩ පදක්කම
08	බිහිරි ක්‍රිකට් තරඟාවලිය -T20	පිරිමි ක්‍රිකට් කණ්ඩායම	ක්‍රිකට් (පැරාලිම්පික්)	ශ්‍රවණාබාධිත ක්‍රිකට්	ඩුබායි	අනුශූරතාවය
09	21 වන ආසියානු කණිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලිය	ඩබ්.වයි.විජේසිංහ ආර්.අයි.විදූශාන් එම්.ඒ.තාමෙල් එස්.ජී.අනුහස්	මළල ක්‍රීඩා	මීටර් 100 x 4 පිරිමි සහය දිවීම	ඩුබායි	රිදී පදක්කම
		ආර්.පී.ඩී.ඒ.ටී.රාජපක්ෂ ජේ.ඕ.එස්.සිල්වා ජී.ඩබ්.ජේ.කිරුල යූ.එච්.නෙත්සර	මළල ක්‍රීඩා	තුන් පිම්ම	ඩුබායි	රිදී පදක්කම
		ඩබ්.වයි.විජේසිංහ ආර්.අයි.විදූශාන් එම්.ඒ.තාමෙල් එස්.ජී.අනුහස්	මළල ක්‍රීඩා	මීටර් 400 x 4 පිරිමි සහය දිවීම	ඩුබායි	ලෝකඩ පදක්කම
		ටී.එන් කොඩිතුවක්කු ජේ.විජේතුංග එම්.පී.දුණුසිංහ එම්.ජී.ප්‍රමුදිකා	මළල ක්‍රීඩා	මීටර් 400 x 4 කාන්තා සහය දිවීම	ඩුබායි	ලෝකඩ පදක්කම
		එච්.එම්.එන්.එම්.හේරත්	මළල ක්‍රීඩා	තුන් පිම්ම	ඩුබායි	රිදී පදක්කම

අනු අංකය	තරඟාවලියේ නම	ක්‍රීඩක/ ක්‍රීඩිකාවගේ නම	ක්‍රීඩාව	ඉසව්ව	පැවැත් වූ රට	දක්ෂතාවය (රන්, රිදී, ලෝකඩ, ශූරතාවය, අනු ශූරතාවය)
10	එක්සත් අරාබි එමීර් කණිෂ්ඨ ග්‍රෑන්ඩ් ප්‍රික්ස් මළල ක්‍රීඩා තරඟාවලිය	නදීෂා රාමනායක යුපුන් අබේකෝන්	මළල ක්‍රීඩා	මීටර් 400 මීටර් 100	ඩුබායි	රිදී පදක්කම ලෝකඩ පදක්කම
11	ඔසාකා මළල ක්‍රීඩා තරඟාවලිය	එච්.කේ.කාලිංග කුමාරගේ	මළල ක්‍රීඩා	මීටර් 400	ජපානය	රන් පදක්කම
12	ටෝකියෝ මළල ක්‍රීඩා තරඟාවලිය	එච්.කේ.කාලිංග කුමාරගේ	මළල ක්‍රීඩා	මීටර් 400	ජපානය	රිදී පදක්කම
13	පළමු ආසියානු සහය දිවීමේ ශූරතාවලිය	පිරිමි සහය දිවීමේ කණ්ඩායම	මළල ක්‍රීඩා	මීටර් 400 x 4	තායිලන්තය	රන් පදක්කම
14	පළමු ආසියානු සහය දිවීමේ ශූරතාවලිය	කාන්තා සහය දිවීමේ කණ්ඩායම	මළල ක්‍රීඩා	මීටර් 400 x 4	තායිලන්තය	රිදී පදක්කම
15	තායිවාන් විවෘත මළල ක්‍රීඩා තරඟාවලිය	එස්.අරුණ දර්ශන	මළල ක්‍රීඩා	මීටර් 400	තායිවානය	රන් පදක්කම
16	තායිවාන් විවෘත මළල ක්‍රීඩා තරඟාවලිය	තරුශි කරුණාරත්න	මළල ක්‍රීඩා	මීටර් 400	තායිවානය	රන් පදක්කම
17	තායිවාන් විවෘත මළල ක්‍රීඩා තරඟාවලිය	තරුශි කරුණාරත්න	මළල ක්‍රීඩා	මීටර් 800	තායිවානය	රන් පදක්කම
18	තායිවාන් විවෘත මළල ක්‍රීඩා තරඟාවලිය	නදීෂා දිල්හානි	මළල ක්‍රීඩා	හෙල්ල විසිකිරීම	තායිවානය	රිදී පදක්කම
19	මළල ක්‍රීඩා ශූරතාවලිය (2nd Belt & Road Athletics invitation meeting)	එස්.අරුණ දර්ශන	මළල ක්‍රීඩා	මීටර් 400	චීනය	රන් පදක්කම
20	19 වන ස්පාඤ්ඤ ජාත්‍යන්තර මළල ක්‍රීඩා ශූරතාවලිය	තරුශි කරුණාරත්න	මළල ක්‍රීඩා	මීටර් 600	ස්පාඤ්ඤය	රිදී පදක්කම
21	19 වන ස්පාඤ්ඤ ජාත්‍යන්තර මළල ක්‍රීඩා ශූරතාවලිය	කාලිංග කුමාරගේ	මළල ක්‍රීඩා	මීටර් 400	ස්පාඤ්ඤය	ලෝකඩ පදක්කම
22	2 වන ආසියානු හෙල්ල විසි කිරීමේ තරඟාවලිය	රුමේෂ් තරංග	මළල ක්‍රීඩා	හෙල්ල විසි කිරීම	කොරියාව	රන් පදක්කම
23	2 වන ආසියානු හෙල්ල විසි කිරීමේ තරඟාවලිය	සුමේධ රණසිංහ	මළල ක්‍රීඩා	හෙල්ල විසි කිරීම	කොරියාව	ලෝකඩ පදක්කම
24	2 වන ආසියානු හෙල්ල විසි කිරීමේ තරඟාවලිය	දිල්හානි ලේකම්ගේ	මළල ක්‍රීඩා	හෙල්ල විසි කිරීම	කොරියාව	ලෝකඩ පදක්කම
25	බහමාස් මළල ක්‍රීඩා ශූරතාවලිය(WACT Silver label-NACAC New life invitational)	එස්.අරුණ දර්ශන	මළල ක්‍රීඩා	මීටර් 400	බහමාස්	රන් පදක්කම
26		ජෝසප් රොෂිටා ටෂ්මිලා කාවින්දි	කැරම්	කාන්තා යුගල කණ්ඩායම	මාලදිවයින	ලෝකඩ පදක්කම
		ෂහීඩ් හිල්මි	කැරම්	ස්විස් ලීග්	මාලදිවයින	රිදී පදක්කම
27	6 වන ආසියානු කැරම් තරඟාවලිය	ජෝසප් රොෂිටා ටෂ්මිලා කාවින්දි හිරුණි මල්ෂාණි තරුෂි හිමන්සක	කැරම්	කාන්තා කණ්ඩායම	මාලදිවයින	රිදී පදක්කම
28		ෂහීඩ් හිල්මි අනාස් අහමඩ් නිශාන්ත ප්‍රනාන්දු හසිත අනුරුද්ධ	කැරම්	පිරිමි කණ්ඩායම	මාලදිවයින	ලෝකඩ පදක්කම

අනු අංකය	තරඟාවලියේ නම	ක්‍රීඩක/ ක්‍රීඩිකාවගේ නම	ක්‍රීඩාව	ඉසව්ව	පැවැත් වූ රට	දක්ෂතාවය (රන්, රිදී, ලෝකඩ, ශූරතාවය, අනු ශූරතාවය)
29	IFBB ආසියානු කායවර්ධන ශූරතා තරඟාවලිය	රංග සිල්වා නිපුණ ලක්ෂාන් කේ.ඩී.මායාදුන්න ආර්.යු.තුෂාර රත්නායක	කායවර්ධන	U168 cm Senior 75 kg Master 40-44 kg Senior 60 kg	මොන්ගෝලියාව	රිදී පදක්කම රිදී පදක්කම රිදී පදක්කම ලෝකඩ පදක්කම
30	2024 ආසියානු ශූරතාවය	ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම	ක්‍රිකට්	ක්‍රිකට් - කාන්තා ජාතික කණ්ඩායම	ශ්‍රී ලංකාව	ආසියානු ශූරතාවය
31	නවසීලන්ත කණ්ඩායමේ ශ්‍රී ලංකා තරඟ සංචාරය	ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම	ක්‍රිකට්	ක්‍රිකට් ජාතික කණ්ඩායම	ශ්‍රී ලංකාව	ශූරතාවය
32	U 15 & U 20 මල්ලවපොර තරඟාවලිය	නෙත්මි අහිංසා	මල්ලවපොර	මල්ලවපොර - කාන්තා	තායිලන්තය	ලෝකඩ පදක්කම
33	20 න් පහළ කාන්තා වොලිබෝල් තරඟාවලිය	20 න් පහළ කාන්තා වොලිබෝල් කණ්ඩායම	වොලිබෝල්	20 න් පහළ කාන්තා වොලිබෝල්	මාලදිවයින	අනුශූරතාවය
34	ජාත්‍යන්තර ජූඩෝ තරඟාවලිය	චාමර නුවන් ධර්මවර්ධන	ජූඩෝ	කි.ග්‍රෑ.73	තායිලන්තය	රන් පදක්කම
35	තායිලන්ත ජාත්‍යන්තර ජූඩෝ තරඟාවලිය	එච්.එම්.ධනුෂාණි ඩබ්.ආර්.පී.ප්‍රේමරත්න එම්.ඒ.මිලාන් ගයාන් අබේසිංහ	ජූඩෝ	කි.ග්‍රෑ.45 කි.ග්‍රෑ.66 කි.ග්‍රෑ.96 කි.ග්‍රෑ.100	තායිලන්තය	රිදී පදක්කම රිදී පදක්කම රිදී පදක්කම රිදී පදක්කම
36	තායිලන්ත ජාත්‍යන්තර ජූඩෝ තරඟාවලිය	ඩී.ජී.චාමිකා එස්.කුමාරසිංහ කේ.එම්.සමීර ඩී.ටෙෂාන්	ජූඩෝ	කි.ග්‍රෑ.55 කි.ග්‍රෑ.70 කි.ග්‍රෑ.66 කි.ග්‍රෑ.55	තායිලන්තය	ලෝකඩ පදක්කම ලෝකඩ පදක්කම ලෝකඩ පදක්කම ලෝකඩ පදක්කම්
37	2024 පොදු රාජ්‍ය මණ්ඩලීය ශූරතාවලිය	අශාන් සචින්තන	බර ඉසිලීම	කි.ග්‍රෑ.61	සුවා, ෆීජී	ලෝකඩ පදක්කම

2.1.2 ඉදිරි ඉලක්ක - 2025

2.1.2 ඉදිරි ඉලක්ක - 2025

1.දක්ෂතා සංවර්ධනය

1. 2026 වර්ෂයේ ජනවාරි මාසයේ දී පකිස්ථානයේ පැවැත්වීමට නියමිත 14 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ දී රන්, රිදී, ලෝකඩ පදක්කම් 300 ක් ලබා ගැනීම.
2. ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට නව තාක්ෂණය සහිත තරඟ අවස්ථාවන් ලබා දී අදියර 4 යටතේ ඔවුන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමෙන් අනතුරුව ජාතික මට්ටමට ක් පැමිණීමේ අවස්ථාව ලබා දීම සඳහා ක්‍රීඩා 33 ක් ඇතුළත් ව 49 වන ජාතික මහා ක්‍රීඩා තරඟාවලිය සැප්තැම්බර් මාසයේ දී පැවැත්වේ.
3. ජාතික මට්ටමේ උසස්ම දක්ෂතා දක්වනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් 50 ක් තෝරා ගෙන දිගු කාලීන විධිමත් පුහුණුවක් සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම හා මූල්‍ය අනුග්‍රහයක් ලබා දීම.
4. ජාතික මට්ටමේ තරඟාවලි ජයග්‍රහණය කළ සුවිශේෂී දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් 900 ක් ක්‍රීඩා 21 ක් සඳහා තෝරා ගෙන ඔවුන්ට රු.10,000.00 ක මාසික පෝෂණ දීමනාවක් ලබා දී විධිමත් ක්‍රමවේදයක් යටතේ සංචිත ගත කර පුහුණුව ලබා දීම.
5. ජාතික තලයේ දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර තරඟාවලි සඳහා සහභාගීවීමට මූල්‍ය දායකත්වය හා අනෙකුත් පහසුකම් සැලසීම.
6. ජාතික සංචිතවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පෝෂ්‍යදායී ආහාරපාන ලබා දීම.

2.යටිතල පහසුකම් සංවර්ධනය

1. වයඹ පළාත් ක්‍රීඩා සංකීර්ණය-බිංගිරිය
   - මීටර් 400 හා මීටර් 200 ධාවන පථ නිම කිරීම
   - ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම
2. සබරගමුව පළාත් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය මාර්තු 30 දිනට නිම කර ප්‍රදේශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබා දීම.
3. වවුනියාව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථයේ ඉතිරි වැඩ නිම කර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට භාවිතය සඳහා ලබා දීම.
4. ඌව පළාත් ක්‍රීඩා සංකීර්ණයේ බණ්ඩාරවෙල පිහිටි ගෘහස්ථ ක්‍රීඩාගාරය මැයි 15 දිනට නිම කර ජනතා අයිතියට පැවරීම.
5. ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ශක්ති වර්ධන ශාලාව හා භෝජනාගාරය පෙබරවාරි 14 දිනට නිම කිරීම.
6. පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ බොක්ෂිං වළල්ල සහිත ගොඩනැඟිල්ල නිම කර බොක්ෂිං වළල්ල ස්ථාපිත කර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ප්‍රයෝජනයට ලබා දීම.
7. නැගෙනහිර පළාත් ක්‍රීඩා සංකීර්ණය- ත්‍රිකුණාමලය
   - මීටර් 400 ධාවන පථය සැප්තැම්බර් මස 30 දිනට නිම කිරීම
   - ප්‍රේක්ෂකාගාරයේ ඉතිරි වැඩ නොවැම්බර් 30 දිනට නිම කිරීම
8. මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය
   - පිහිණුම් තටාකයේ ඉතිරි වැඩ නිම කිරීම
   - මීටර් 400 ධාවන පථයේ ඉතිරි වැඩ නිම කිරීම
   - ප්‍රේක්ෂකාගාරයේ හා ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම
9. කල්මුණේ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම

අධ්‍යක්ෂ ජනරාල්

03. පරිච්ඡේදය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	සත්‍ය 2024 රු.	සත්‍ය 2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,322,418,384	1,110,128,000	ඒසීඒ-3
-	තැන්පතු		203,511,652	38,420,869	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		13,341,025	13,975,590	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**2,539,271,061**	1,162,524,459	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**2,539,271,061**	**1,162,524,459**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		2,539,271,061	1,162,524,459	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
223,041,677	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	207,010,961	179,888,705	ඒසීඒ-2(ii)
560,102,200	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	501,138,352	632,148,471	ඒසීඒ-2(ii)
841,300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	777,589,327	894,654	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
97,800	වෙනත් පුනරාවර්තන වියදම්	9	93,300	750	ඒසීඒ-2(ii)
1,624,541,677	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,485,831,940**	**812,932,580**	
	මූලධන වියදම්				
822,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	801,679,613	241,335,559	ඒසීඒ-2(ii)
332,196,384	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	218,414,840	63,973,991	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
2,000,000	හැකියා වර්ධනය	14	984,600	3,147,909	ඒසීඒ-2(ii)
1,000,000	වෙනත් මූලධන වියදම්	15	-	64,434,507	ඒසීඒ-2(ii)
1,157,696,384	**මුළු මූලධන වියදම් (උ)**		**1,021,079,053**	**372,891,966**	
	තැන්පතු ගෙවීම්		180,479,094	77,591,375	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		12,212,828	13,950,984	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		192,691,922	91,542,359	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		2,699,602,915	1,277,366,905	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(160,331,854)	(114,842,446)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(160,331,854)	(114,842,446)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			(0)	0	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	4,011,779,749	3,877,451,950
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	49,999,596	108,384,791
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**4,061,779,345**	**3,985,836,741**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(89,579,780)	(104,602,825)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		4,011,779,749	3,877,451,950
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	12,079,680	69,349,972
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	127,499,696	143,637,644
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**4,061,779,345**	**3,985,836,741**

පිටු අංක 01 සිට 39 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 40 සිට 47 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2024.12.16** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 27/02/2025
දිනය : 27/02/2025	දිනය : 27/02/2025	
ඒ .එච්. එම්. යූ. අරුණ බණ්ඩාර ලේකම් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07.	ශේමාල් ප්‍රනාන්දු ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව නො. 09, පිලිප් ගුණවර්ධන මාවත කොළඹ 00700, ශ්‍රී ලංකාව.	එස්.ඩී.එන්. ඇන්ජලෝ පාලිත ප්‍රධාන ගණකාධිකාරි ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව කොළඹ 07 දු.අංක: 011 2697001. 0714276009

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

[illegible]

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
මුළු බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		65,882,311	41,237,656
අග්‍රිම ලැබීම්		2,322,418,384	1,110,128,000
අත්තිකාරම් අයකර ගැනීම්		12,518,749	14,287,708
තැන්පතු ලැබීම්		203,511,652	38,420,869
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**2,604,331,096**	**1,204,074,233**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		1,457,325,126	306,169,791
සහනාධාර සහ මාරුකිරීම්		736,858	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		8,333,113	2,255,594
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		-	-
අත්තිකාරම් ගෙවීම්		12,025,728	14,368,507
තැන්පතු ගෙවීම්		180,479,094	77,591,375
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**1,658,899,919**	**400,385,266**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**945,431,177**	803,688,967
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>			
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම		945,431,177	**803,688,967**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		**945,431,177**	**803,688,967**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		**(945,431,177)**	**(803,688,967)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-	-
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව (රු)		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.99.00	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම්	15,000,000.00	-	54,748,951.53	364.99 %
2002.02.99	පොලී හා අනෙකුත්	14,000,000.00	-	1,674,071.47	12.00 %
2004.01.00	W & OP	6,000,000.00	-	8,253,121.54	137.55 %

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,600,000,000.00	1,624,541,677.00	1,485,669,973.00	91%
ප්‍රාග්ධන	1,000,000,000.00	1,157,696,384.00	989,335,903.20	80%

3.7 මු.රෙ.**208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන යේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය		4,528,725.77	4,528,725.77	3,907,356.77	86.28 %
02	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව		552,462.12	552,462.12	552,462.12	100 %

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු)	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	300,091,008.88	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	192,199,788.83	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	3,519,488,951.19	-	-

3.9 **විගණකාධිපති වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්වයිජ්/ඒ/ඩීඑස්ඩී/2/24/30 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 ජුනි 26 දින

ගණන්දීමේ නිලධාරී
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

විගණිත මූල්‍ය ප්‍රකාශනයේ පිටපතක් හා උක්ත වාර්තාව මේ සමඟ එවමි.

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරා[illegible]
27 JUN 2025
අංක. 09, ෆිලිප් ගුණවර්ධන මාවත.
කොළඹ 07.

එම්.පී.අයි.එම්. රශ්මි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව. (විගණිත මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා සම්පිණ්ඩන වාර්තාව මේ සමඟ එවමි)

2. ලේකම්, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය - කරු. අවශ්‍ය කටයුතු සඳහා.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්වයිඒ/ඒ/ඩීඑස්ඩී/2/24/30 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 ජුනි 26 දින

ගණන්දීමේ නිලධාරී
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 25 දින නිකුත් කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නිශ්චය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්. සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ස්ථාවර වත්කම් වටිනාකම රු. 4,011,779,749 ක් වූ අතර, ඉන් රු.3,519,488,951 ක් එනම් සියයට 88 ක්ම කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවද එම කෙරීගෙන යන වැඩ ශේෂය තුල පැවති වැඩ නිම කළ ව්‍යාපෘති වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. තවද, කෙරීගෙන යන වැඩ ශේෂය තුළ දෙපාර්තමේන්තුව විසින් වැඩ නිමකර වෙනත් රජයේ ආයතන හා පාසල්වලට භාරදී ඇති රු. මිලියන 682.62 ක් වටිනා ව්‍යාපෘති 10 ක්ද ඇතුළත්ව තිබුණු අතර, එම ව්‍යාපෘති හඳුනාගෙන එම ආයතන වලට විධිමත් ලෙස පවරා දී ගිණුම්වලට ඇතුළත් කිරීමෙන් පසු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව විසින් වර්ෂ කිහිපයකට පෙර ඉදි කරන ලද ටොරින්ටන් හොකී ක්‍රීඩාංගනය සහ මාතලේ හොකී ක්‍රීඩාංගනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙළින් රු.154,193,000 ක් හා රු165,701,785 ක් වැඩිදියුණු කිරීම් සිදු කර තිබුණ ද දෙපාර්තමේන්තු ගිණුම් පොත්වල මූල්‍ය නොවන වත්කම් යටතේ හඳුනාගෙන නොතිබුණි.

1.5.2 අත්තිකාරම් ගෙවීම්

(අ) අත්තිකාරම් බී ගිණුමේ (ඇමුණුම 1.1 යටතේ) දක්වා ඇති ලැබීම් හා ගෙවීම් එකතුව අතර සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සැසඳුම් ප්‍රකාශයේ දක්වා ඇති රජයේ නිළධාරින්ට ලැබීම් හා ගෙවීම් අතර රු. 166,800 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් ඒ.සී.ඒ-5 ආකෘතියේ 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂය රු. 37,919,916 ක් ලෙස ඇතුලත් කර තිබුණි. එසේවුවද භාණ්ඩාගාර SA 52 ආකෘති පත්‍රය අනුව එදිනට අනුරූපි ශේෂය රු. 37,882,016 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව දෙපාර්තුමේන්තු පොත් වල සඳහන් අවසාන ශේෂය හා භාණ්ඩාගාර SA 52 ආකෘතිය අනුව ශේෂය අතර රු. 37,900 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) අත්තිකාරම් "බී" ගිණුමට අනුව හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.706,855.00 ක් විය. ඉන් සේවය අතහැර ගොස් ඇති නිලධාරී සිව් දෙනෙකුගෙන් වර්ෂ 1-3 කාලය අතර රු.222,435ක ණය ශේෂය මෙතෙක් අදාල පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.5.3 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

කල්මුනේ ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාර ව්‍යාපෘතිය වෙනුවෙන් 2020.12.16 දින රු.28,529,654 වැඩ අත්තිකාරමක් ලබා දී ඇති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින විට අත්තිකාරම් ශේෂය රු. 5,681,380 ක් විය. ව්‍යාපෘතිය වෙනුවෙන් 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු අතර අත්තිකාරම් මුදල් ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදි කිරීම සඳහා වූ බිල්පත මගින් අයකර ගැනීමට කටයුතු කර ඇති බවට දන්වා තිබුණ නමුත් මෙතෙක් එම අත්තිකාරම් මුදල් අයකර නොගැනීම හේතුවෙන් තවදුරටත් ශේෂයක් පවතින අතර මේ දක්වා ලබා දී ඇති අත්තිකාරම් පියවා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

1.5.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ක්‍රීඩා ශක්ති ජාතික වැඩසටහන යටතේ ක්‍රීඩක පෝෂණ දීමනාව වශයෙන් ජාතික ක්‍රීඩා සංගම් හෝ සම්මේලන 03 ක හා අභියාචනා කමිටු නිර්දේශ ඇතුළු ක්‍රීඩකයින් 193 දෙනෙකුට රු. 3,670,000 ක් ගෙවීම් කර තිබූ නමුත් ක්‍රීඩකයින් එම මුදල් ලබා ගත් බවට අත්සන් හෝ අදාල ගිණුම්වලට බැංකු ගත කිරීමේ රිසිට්පතක් නොතිබුණි. ඒමෙන්ම, වෙඩි තැබීමේ ක්‍රීඩකයින්ගෙන් එක් ක්‍රීඩකයකුට පමණක් මසකට රු. 45,000 ක පෝෂණ

දීමනාවක් ලබා දී තිබුණි. මසකට රු.10,000 බැගින් මුදල් ගෙවීමට තීරණය කර තිබුණද, එක් ක්‍රීඩකයකුට පමණක් රු.45,000 ක් ගෙවීම අවිධිමත් ගෙවීම් ලෙස නිරීක්ෂණය වූ අතර මෙලෙස ගෙවීම් කිරීමට අදාළ විශේෂ අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) 2024 වර්ෂයේ පවත්වන ලද ඉන්දු ශ්‍රී ලංකා හබල් ඔරු තරඟාවලිය සඳහා ක්‍රීඩකයින් සහ නිලධාරීන්ට අවශ්‍ය නවාතැන් පහසුකම්, සනීපාරක්ෂන සේවා, ආහාරපාන, තරඟකරුවන්ට සහතික පත්‍ර, පදක්කම් සහ කුසලාන යනාදිය ඇතුලත් සේවාවන් ප්‍රසම්පාදනයන් කර ගැනීම සඳහා රු. 3,924,587 ක මුදලක් වැය කර තිබූ නමුත් අදාල බිල්පත් හෝ ඉන්වොයිසිපත් විගණනයට ඉදිරිපත් නොවීය. තවද, තරඟාවලිය සඳහා ලබා දෙන ආහාර වර්ග නාවික හමුදාව මගින් ගැනීම සඳහා ඇස්තමේන්තු ගත වියදම රු. 1,598,887 ක් වූ අතර පහසුකම් ලබා ගත් ක්‍රීඩකයින්ගේ, නිලධාරීගේ හා පුහුණුකරුවන්ගේ විස්තර ඇතුලත් නාමලේඛනයක් හෝ සහභාගීත්වය තහවුරු කිරීමට අදාල කිසිදු ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවීය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.3 (ආ)	කෙරීගෙන යන වැඩ ශේෂය තුළ පවතින දැනටමත් වැඩ අවසන් කර ඇති වත්කම් විධිමත් පරිදි ගිණුම් ගත කිරීමෙන් පසු අදාළ පාර්ශ්වය වෙත පවරා දී මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුයි යන නිර්දේශය	1.5.1 (අ) ඡේදය

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 හි දක්වා ඇති විධිවිධාන අනුගමනය කරමින් නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු

සකසාගෙන තිබීම හේතුවෙන් වැය විෂයන් 03 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ගෙන තිබූ රු. 3,500,000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමනින්ම ඉතිරිකරගෙන තිබුණු අතර තවත් වැය විෂයකට (පිරිසිදු කිරීම සහ සනීපාරක්ෂක) අධි ප්‍රතිපාදන සලසාගෙන තිබීමෙන් එම ප්‍රතිපාදනයෙන් සියයට 80 ක ප්‍රතිශතයකින් වෙනත් වැය විෂයකට මාරුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල රු. 288,918,782 ක මුදලක් ජාතික ක්‍රීඩා සංගම් හෝ සම්මේලන වලට ලබාදී තිබුණු බවට විගණනය වෙත වාර්තා කර තිබුණද ශ්‍රී ලංකා හොකී සම්මේලනය හා ශ්‍රී ලංකා ස්කොෂ් සම්මේලනය ඇතුළු සම්මේලනවලට ලබා දී තිබෙන මුදල් එම සංගම් වල නිවරදි ලෙස සටහන් කර නොතිබීම විගණනයට නිරීක්ෂණය වීමෙන් දෙපාර්තමේන්තුව ඒ පිළිබඳව පසුවිපරම් කර තහවුරු කරගැනීමට අපොහොසත් වී තිබූ බව තහවුරු විය.

3.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ටොරින්ටන් හොකී ක්‍රීඩාංගනයේ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ඉතිරි මුදල රු. 4,496,780 සහ මාතලේ හොකී ක්‍රීඩාංගනය වෙත ගෙවිය යුතු රු. 48,365,310 මුදල දෙපාර්තමේන්තු ගිණුම් පොත්වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 756(6)	භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඊට පසු වර්ෂයේ ජූනි මස 15 දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර සමීක්ෂණ වාර්තාව 2025 අප්‍රේල් 01 දින එනම් මාස 09 ක් ප්‍රමාද වී ලබා දී තිබුණි.
	(ii)මුදල් රෙගුලාසි 104	කුලියාපිටිය සුභාරතී විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ දී සිදුවී තිබෙන මූල්‍ය වංචාව පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකිරීමට නිර්දේශ කර තිබුණු අතර ඒ සඳහා කමිටුවක් පත් කර තිබුණද 2025 මැයි දක්වා අදාළ කමිටු සාමාජිකයින් ගෙන් වාර්තාවක් ලබා ගෙන එම වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කිරීමට දෙපාර්තුමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) අංක 01/2024 දරන හා 2024 ජනවාරි 01 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය

(i) පොදු උපදෙස් අනු අංක 12.3

චක්‍රලේඛ ප්‍රකාරව සුහද හමුවීම්, ප්‍රියසම්භාෂණ ආදිය වෙනුවෙන් රජයේ අරමුදල් භාවිතා නොකළ යුතු වුවද දෙපාර්තුමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් පැවති ශ්‍රී ලංකා රග්බි ක්‍රීඩකයින් සඳහා වූ ප්‍රියසම්භාෂණය වෙනුවෙන් කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට රු. 2,429,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) පොදු උපදෙස් අනු අංක 12.4

48 වන ජාතික ක්‍රීඩා තරඟාවලිය - 2024 ට සමගාමීව දෙපාර්තමේන්තුවේ සේවා නියුක්තිකයන් සඳහා රු. 9,920,160 වියදමක් දරා ටී ෂර්ට්ස්, බොටම්ස්, කැප්ස්, ෂර්ට්ස්, කලිසම්, බෑග්ස්, සාරි, කුඩ යනාදිය ප්‍රසම්පාදනය කිරීමේදි සැපයුම්කරු තෝරාගත් පදනම විගණනයට වාර්තා කර නොතිබූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට හා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් මෙම කාර්යය හදිසි මිලදී ගැනීම් ලෙස සලකා කටයුතු කර තිබුණි.

(ඇ) අංක 06/2024 දරන හා 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය

3.1 ඡේදය

CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මගින් ගනු ලබන ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ශේෂ පිරික්සුම මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොතිබුණි.

(ඈ) අංක 2382/32 හා 2024 මැයි 03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළකරන ලද 2024 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝග

(i) I කොටසේ 8 වගන්තිය

දැනටමත් ලියාපදිංචි වී ඇති සියලු ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ තක්සේරු / ඇගයීම් කිරීම් කොට වර්ගීකරණය කිරීම සඳහා සාමාජිකයන් 05 දෙනෙකුට නොවැඩි කමිටුවක් පත්කල යුතු වූවද එම කමිටුව පත්කර වර්ගීකරණය සිදුකිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ii) III කොටසේ 6 (viii) හා (ix) වගන්තිය	සෑම ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනයක්ම ක්‍රීඩකයන්ගේ හැකියාවන් හා නිපුණතාවන් වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් සැපයීම හා ක්‍රීඩකයන්ගේ ජීව දත්ත, සහභාගී වූ තරඟ අවස්ථා, ක්‍රීඩා තරඟ තරඟාවලින්, නියෝජනය කළ කණ්ඩායම්, ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු සහ තේරීම, ශ්‍රේණිගත කිරීම් හා වර්ගකිරීම් ලබා දී ඇති අවස්ථාවකදී එකී තේරීම්, ශ්‍රේණිගත කිරීම සහ වර්ගකිරීම්වලින් සමන්විත වන ක්‍රීඩක දත්ත සමුදායක් භාවිත කිරීම මගින් ඉහළ නිපුණතා සහිත මලල කීඩකයන් හඳුනාගැනීමේ පද්ධති පවත්වාගෙන යා යුතු වූවත් නියෝග ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.4 අවිධිමත් ගනුදෙනු

ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා Dialog ආයතනය එක්ව සංවිධානය කර තිබූ Sri Lanka Sports Fiesta 2024 වැඩසටහන 2024 අගෝස්තු 16,17 හා 18 දිනයන්වල ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රීඩා අරමුදලෙන් සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් එකතුව රු.මිලියන 40ක මුදලක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර ඉන් රු.39,059,500 ක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩසටහන් සඳහා වැය කර තිබුණි. මෙම වැඩසටහන ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා Dialog ආයතනය එක්ව සංවිධානය කර තිබුණ ද ඒ සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. මෙම වැඩසටහන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, හෝ ක්‍රීඩා අමාත්‍යාංශයේ හෝ ක්‍රීඩා අරමුදලේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වැඩසටහනක් නොවූ අතර Dialog ආයතනය මගින් වැඩසටහන සඳහා ලබා දී තිබුණු දායකත්වය හා වැඩසටහන ක්‍රියාත්මක කළ දින 03 තුල පවත්වා ගෙන ගොස් තිබුණු ආහාර පාන අලෙවි සැල් තුලින් උපයා ගන්නා ලද කිසිදු ආදායමක් හෝ අනුග්‍රාහක මුදලක් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.

මෙම වැඩසටහනට සමගාමීව පැවැත්වෙන ක්‍රීඩා තරඟාවලිය පැවැත්වීම සඳහා රු.16,800,000 ක මුදලක් නිදහස් කර තිබූ අතර මුදල් ලබාදීමට ප්‍රථම වියදම් ඇස්තමේන්තුවක් හෝ සකසාගෙන නොතිබුණි. තවද, ඉහත අරමුදල් ලබාදී මාස 08ක් ඉක්මවූවද, මේ දක්වා වියදම් වාර්තා හා බිල්පත් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි. හොකී ක්‍රීඩා තරගාවලිය පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා හොකී සම්මේලනය වෙත රු. 3,500,000 ක මුදලක් ලබා දී තිබුණ ද එම තරඟය නොපවත්වා තිබියදීත් රු. 1,972,548 ක් පමණක් දෙපාර්තුමේන්තුවට ආපසු ලබා දී තිබීමෙන් රු.1,527,452 ක් රජයට අහිමි කර තිබුණි.

තව ද, මෙම වැඩසටහන පැවැත්වීම සඳහා ඉසව් කළමනාකරණ ආයතනයක් තෝරා ගෙන තිබූ අතර එම ආයතනය තෝරාගත් පදනම කුමක්ද යන්න විගණනයට වාර්තා නොවීය. තවද එම ආයතනයෙන් ලබාගත් සේවාවලට සමාන සේවාවන් ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම විසින්ද ලබා දී තිබීමෙන් එම ආයතනය සඳහා දරන ලද රු.19,913,000 ක වියදම් විනිවිදභාවයකින් යුතුව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, උක්ත ඉසව්

24

කලමණාකරණ ආයතනයට ඉසව් සම්බන්ධීකරණ ගාස්තු සඳහා ද රු. 1,400,000 ක මුදලක් ගෙවා තිබුණි.

වැඩසටහන පැවැත්වීමට නියමිතව තිබූ දින කිහිපයකට පසු ජනාධිපතිවරණය කැඳවීමට නියමිත බැවින් ක්‍රීඩා උළෙලට සමගාමීව ක්‍රියාත්මක කිරීමට යෝජිත සංගීත සංදර්ශනය නොපවත්වන ලෙස මැතිවරණ කොමිසන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් විසින් දැනුම් දී තිබියදී උපදෙස්වලට පටහැනිව ආහාර ප්‍රවර්ධන වැඩසටහන්, සංගීත සංදර්ශන යනාදිය පවත්වා තිබුණු අතර ඒ සඳහා ජාතික තරුණ සේවා සභාව හා තරුණ සේවා පුද්ගලික සමාගම විසින්ද රු. 16,316,448 ක වියදමක් දරා තිබුණි.

3.5 තැන්පතු

(අ) දෙපාර්තමේන්තුවේ අවුරුදු 2 ට වැඩි තැන්පතු ප්‍රමාණය රු. 67,565,979 වන අතර ඒවා සියල්ල ඉදිකිරීම් හා අළුත්වැඩියා සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති 136 කට අදාලව රඳවුම් මුදල් බව නිරීක්ෂණය වූ අතර ඉන් ව්‍යාපෘති 39 ක ඉදිකිරීම් අවසන් කර ඇති නමුත් මෙ වන තෙක් නිදහස් නොකළ තැන්පතු වටිනාකම රු. 11,302,388 ක් එනම් මුළු රඳවුම් වටිනාකමින් සියයට 17 ක් බව නිරීක්ෂණය විය. නමුත් එම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුව විසින් එම රඳවුම් මුදල් නිදහස් කිරීමට අවශ්‍යතාවයක් තිබෙද යන්න සලකා බලා අවශ්‍ය පරිදි කටයුතු කර ද නොතිබුණි.

(ආ) පොදු තැන්පතු ගිණුමේ පවතින රඳවුම් මුදල් වලින් අවුරුදු 2 -5 කාල පරාසයක් සහිත අත්හිටවූ ව්‍යාපෘතිවලට අදාල රු 1,025,137ක රඳවුම් මුදල් ද අවුරුදු 05කට වඩා වැඩි කාලයක සිට අත්හිටුවා ඇති ව්‍යාපෘති 8 කට අදාලව රු.3,502,776 ක රඳවුම් මුදල් ද හා රජයේ ආදායමට බැර කළ යුතු තවත් ව්‍යාපෘති 04කට අදාළ රු. 362,360 ක රඳවුම් මුදල් රාජ්‍ය ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවට විගණනය වෙත වාර්තා කර තිබුණද මෙතෙක් එම රඳවුම් මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉදිකිරීම් කාලය ඉක්මවී තිබුණද මෙතෙක් වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 50 කට අදාල රු.31,792,332 ක රඳවුම් තැන්පතු පොදු තැන්පත් ශේෂයන් තුල පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරිම

(අ) 2024 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ අනුකූලතා වාර්තාව අනුව මහජනයා වෙත තොරතුරු ලබා දීම සඳහා ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී

වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට අවශ්‍ය නිල වෙබ් අඩවියක් නිර්මාණය කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් 2024 ජාතික ක්‍රීඩා දින දර්ශනයට අනුව ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනවල ජාතික හා ජාත්‍යන්තර තරඟ පැවැත්වීමේ ප්‍රගතිය විගණනය වෙත ලබා දීමට අපොහොසත්වී තිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා 2024 වර්ෂයේ දී රු.මි. 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුල දී ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ආ) ක්‍රීඩා ශක්ති වැඩසටහන මගින් පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ආධාර ලබා දෙන නමුත් ඔවුන්ගේ ප්‍රගතිය සම්බන්ධව පසු විපරම් කිරීමක් සිදු නොවන බව නිරීක්ෂණය වූ අතර කාර්යසාධනය පරීක්ෂා කර ආධාර ලබා දීය යුතුවේ.

(ඇ) රුපියල් මිලියන 8.56 ක් වැය කර 2021 වර්ෂයේ නිම කරන ලද පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවළගස්වැවේ සාලිය ආදර්ශ පාසලේ ප්‍රේක්ෂකාගාරයේ පඩිපෙළ ඇතුළුව සිමෙන්ති කොටස් අතුරා නොතිබීම, වැසිකිළි පද්ධතියේ උපාංග හා ඇඳුම් මාරු කරන කාමරවල දොර ජනෙල් සවිකිරීම නිසි පරිදි සිදුවී නොතිබීම මත 2024 වර්ෂයේ අවසානය වන විට භාවිතයට ගත හැකි මට්ටමට ඉදිකිරීම සිදුකර නොතිබුණු අතර 2025 වර්ෂයේදී ද ප්‍රතිපාදන වෙන්වී නොමැති බැවින් එම වියදමෙන් අපේක්ෂිත කාර්ය ඉටු කර ගත නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පිහිණුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මි. 62.26 ක වියදමක් දරා තිබුණ ද, මේ දක්වා වැඩ අවසන් කර නොතිබුණි.

4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

බිංගිරිය පළාත් ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය යටතේ ඉදිවෙමින් පවතින මීටර් 200 ධාවන පථය හා මීටර් 400 ධාවන පථය සඳහා 2024 වර්ෂයේ දී පිළිවෙලින් රු.මි. 40 ක හා රු.මි. 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දී ඇති වී තිබූ ගැටලු නිසා 2024 වර්ෂය අවසාන වන තෙක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. එසේ තිබියදී 2024 දෙසැම්බර් 31 වන විට මීටර් 200 හා මීටර් 400 ධාවන පථයන් ඉදිකිරීමට

පිළිවෙලින් රු.මි.2.690 ක හා රු.මි.7.690 ක වියදම් දරා තිබුණි. එසේ වුවද මෙම ඉදිකිරීම් වල වැඩ 2024 දෙසැම්බර් 31 වන විටත් අවසන් වී නොතිබුණි.

4.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ අත්හිට වූ ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් අයකර ගැනීමට ඇති අත්තිකාරම් මුදල් රු. 6,398,300 ක් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය බුන්වත් වීම නිසා අයකර ගැනීමට නොහැකි නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) 2024 වර්ෂයේ ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම් ප්‍රතිපාදන භාවිතා කරමින් ක්‍රීඩා උපකරණ කට්ටල 200 ක් රු. 16,590,000 මිලකට මිලදී ගෙන බෙදා හැර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) ප්‍රකාරව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීමකින් තොරව හා කිසිදු ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය නොකර මෙම ප්‍රසම්පාදනය සිදු කර තිබුණි. තවද, එම උපකරණ කට්ටල 200 කුමන පාර්ශවයන්හට ලබාදුන්නේද යන්න තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට ක්‍රීඩා උපකරණ කට්ටල 68 ක් අදාල පාර්ශවයන් වෙත බෙදා නොදී නිශ්කාර්යව ගබඩාකර තිබුණු අතර උපකරණ කට්ටල බෙදා දීම් සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් සකසා ඒ සඳහා නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) පැරිස් ඔලිම්පික් තරඟාවලියේ විදේශ නිලධාරීන්ට තිළිණ භුවමාරුව වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මුලුමනින්ම උල්ලංඝනය කරමින් නිලධාරියකු වෙත රු. 270,000ක මුදලක් ග්‍රෑම් 500 කජු පැකට් 45ක් මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි. පවතින වෙළඳපල මිලට අනුව ඉතා ඉහල ගුණාත්මකභාවයකින් යුත් ග්‍රෑම් 500 කජු පැකට්ටුවක් එයින් අඩකට පමණ මිලකට මිල දී ගැනීමේ හැකියාවක් තිබිය දී එය නොසලකා ඊට වඩා අසාමාන්‍ය මිල ගණන්වලට මිලදී ගෙන තිබීමෙන් හා මෙම ප්‍රසම්පාදනය විනිවිදභාවයකින් තොරව සිදු කර තිබීමෙන් රජයට රු. 112,050 පාඩුවක් සිදුකර තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුව සතුව වාහන 12ක් පවතින අතර ඉන් එක් වාහනයකට අදාළව අළුත්වැඩියා පරීක්ෂා කිරිමේදි, කරන ලද අළුත්වැඩියාවන් සම්බන්ධ අමතර කොටස් කිසිවක් වාහනයේ නොපවතින බවත් දැනට එම කොටස් පළුදු සහ යථා තත්ත්වයේ නොමැති ඒවා බවත් රජයේ නියෝජිතායතනය මගින් සේවා කිරිමේදි දන්වා තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිළධාරීන්ගෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කලයුතු බව නිරීක්ෂණය කෙරේ. තවද, දෙපාර්තමේන්තුව සතුව ධාවනයේ නොපවතින වාහන 02ක් තිබෙන අතර එවායේ අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවීම නිසා අළුත්වැඩියා කිරීමට අනුමැතිය ලබාදි නොතිබුණ ද සමාලෝචිත වර්ෂයේ මෙම වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

27

4.4 පාඩු හා හානි

(අ) 2024 අප්‍රේල් 03 දින සිට අප්‍රේල් 22 දක්වා කිරිගිස්ථානයේ දී පැවැත්වූ Senior Asian Wrestling Tournament, Asian Olympic Games Qualifiers and Training Programme - 2024 සඳහා පුහුණුකරු ඇතුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් 06 දෙනෙකු සහභාගී වීමට ආරාධනා පත්‍රයේ සඳහන් පරිදි ඊ වීසා ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා වීසා ගැටළුවක් ඇති වී අදාල ගුවන් යානය මග හැරී තිබුණි. එම නිසා පළමු අවස්ථාවේ දී ටිකට් මිල දී ගැනීමට දැරූ රු.1,486,200 ක් වන ගාස්තුවෙන් ලබා ගත් අදාල ගුවන් ටිකට් පත් භාවිතා කිරීමට සිදු වී ඇත්තේ ආපසු පැමිණීමේ දී පමණි. පසුව ඊ වීසා හරහා අදාල තරඟාවලියට පිටත් වීම සඳහා නැවත රු. 1,193,400 ක මුදලක් වැය කර තිබුණි. මේ නිසා රජයට රු.1,193,400 ක මුදලක් අහිමි වී ඇති අතර ක්‍රීඩකයින්ට දින 5 ක් පමණ ප්‍රමාද වී අදාල තරඟාවලිය සහ වැඩසටහන් සඳහා සහභාගී වීමට සිදු වී තිබුණි.

(ආ) ටජිකිස්ථානයේ පැවති Dushanbe Ground Slam – 2024 Judo Championship තරඟාවලිය සඳහා සහභාගිවූ ක්‍රීඩකයින් දෙදෙනෙක් සහ පුහුණුකරු වෙත දින 4 ක් සඳහා නවාතැන් ගාස්තු ගෙවීම වෙනුවට දින 6 ක් සඳහා ගෙවා තිබීමෙන් රු.301,290 ක පාඩුවක් සිදුවී තිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) සමාලෝචිත වර්ෂයේ දී කාර්යමණ්ඩල පුහුණුව සඳහා රු.මි. 1 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද ඉන් රු.මි. 0.177ක් පමණක් උපයොජනය කර ඇති අතර 2024 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රගතිය 11% කි. ඒ අනුව පුහුණු වැඩසටහන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි.

(ආ) 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග III කොටසේ 7 (xii) අනුව ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන විසින් එළඹෙන වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය අවසන් වීමට මාස 03 කට පෙර අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කලයුතු වුවත් දැනට ලියාපදිංචි ක්‍රීඩා සංගම්/ සම්මේලන 74 ක් අතුරින් සංගම්/ සම්මේලන 48 ක් පමණක් ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර තිබුණි. ක්‍රීඩා සංගම් / සම්මේලන 52 ක් පමණක් 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඒවායින් අක්‍රිය සංගම්/ සම්මේලන 8 ක් තිබෙන බව නිරීක්ෂණය විය.

(ඇ) ක්‍රීඩා සංගම් වල විධායක මණ්ඩලයේ නිලකාලයට පෙර ධූරය අත්හිටුවීමේදී එවකට පැවති වත්කම් නිසි ලෙස ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්ගේ භාරයට ගැනීමෙන් පසු අතුරු පාලන කමිටුව භාරයට ගැනීමෙන් විශාල මූල්‍ය වංචාවක් සිදු කර ඇති අතර අත්හිටුවීමෙන් පසුවද මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට නොහැකි තත්වයක් උත්ගතවී ඇත. මේ හේතුවෙන් ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය, ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් සංගමය යන සංගම් 2024 මූල්‍ය ප්‍රකාශන ලබා දී නොතිබුණි. මෙම තත්වය මගහරවා ගැනීමට කාර්තුමය වශයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට ජාතික ක්‍රීඩා සංගම් දැනුවත් කිරීමක් හෝ කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ කාර්යයන් වෙනුවෙන් ජාතික ක්‍රීඩා අරමුදලෙන් ගෙවීම් කරන ලද කාර්යයන් අතරින් 13 ක් සම්බන්ධයෙන් ගෙවා තිබූ රු.6,427,825 කට අදාල බිල්පත් හා අනෙකුත් උපයෝගී ලේඛන 2025 මාර්තු මස වන විටත් ක්‍රීඩා අරමුදල වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2024 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 395 ක් වූ අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක් ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 16 ක් ද, ද්විතික මට්ටමේ පුරප්පාඩු 78 ක් ද, ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 22 ක් ද, ඇතුළුව මුළු පුරප්පාඩු 124 ක් පැවතුණි. ඒ අනුව, පුරප්පාඩු සේවක සංඛ්‍යාව 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී 11 කින් වැඩි වී තිබුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

එම්.පී.අයි.එම්. රශ්මි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

29

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
1. අදාල වර්ෂය තුළ නිමකල ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රමාණය	_	√	-
2. අන්තර්ජාතික පදක්කම් ප්‍රමාණය	_	√	-

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50 % - 74%	75% - 100%
නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගෙම සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම.	ජාතික මට්ටමින් ක්‍රීඩා උළෙල පැවැත්වීම	ජාතික මහා ක්‍රීඩා උළෙල දී පිහිටු වන ලද ශ්‍රී ලංකා වාර්තා ගණන	√	_	_
	දැනට ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතා කරන සංඛ්‍යාව වාර්ෂිකව 20% කින් ඉහළ නැංවීම	ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතයට ගන්නා පුද්ගලයින් ප්‍රමාණය			
සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	2028 වන විට ප්‍රධාන ක්‍රීඩා 5කින් ඔලිම්පික් පාරිසාධන මට්ටම කරා ළගාවීම හා ජයග්‍රහණයක් ලබා ගැනීම	හඳුනාගත් ක්‍රීඩා තරඟාවලින්හි දී සහ ශූරතාවලදී දිනාගත් ජාත්‍යන්තර පදක්කම් ගණන	_	√	_

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජයග්‍රහණ :

- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලියේ දී F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් ලෝක වාර්තාවක් සමඟින් සමිත දුලාන් විසින් රන් පදක්කම දිනා ගැනීම
- 2024 ප්‍රංශයේ පැරිස් හි පැවති පැරාලිම්පික් තරඟාවලියේ F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් සමිත දුලාන් විසින් රිදී පදක්කම දිනා ගැනීම
- මොරොක්කෝවේ පැවති 2024 ග්‍රෑන්ඩ් පික්ස් ලෝක පැරා මලල ක්‍රීඩා තරඟාවලියේ දී රන් පදක්කම් 02 ක් හා රිදී පදක්කම් 05 ක් දිනා ගැනීම
- 21 වන ආසියානු කණිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලියේ දී රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02 ක් පදක්කමක් දිනා ගැනීම
- තායිවානයේ පැවති විවෘත මළල ක්‍රීඩා තරඟාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් හා තරුශි කරුණාරත්න විසින් මීටර් 400 හා මීටර් 800 ඉසව්වෙන් රන් පදක්කම් 2 ක් දිනා ගැනීම.
- ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම විසින් 2024 ආසියානු ශූරතාවය දිනා ගැනීම.
- IFBB ආසියානු කායවර්ධන ශූරතා තරඟාවලියේ දී රිදී පදක්කම් 03 ක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම විසින් නවසීලන්තය සමඟ පැවති ටෙස්ට් තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීම

අභියෝග :

- අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමේදී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු 124 ක් පැවතීම මත රාජකාරී කටයුතු සිදුකර ගෙන යාමේදී දැඩි දුෂ්කරතා පැන නැගීම.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	17	09	08	-
තෘතියික	23	07	16	-
ද්විතියික	254	176	78	-
ප්‍රාථමික	101	79	22	-
එකතුව	**395**	**271**	**124**	**-**

06.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පුරප්පාඩුව පවතින තනතුරුවලට අදාල රාජකාරී සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව අතර බෙදාදීම මගින් අදාල රාජකාරී ආවරණය කර ගන්නා අතර, මෙම පුරප්පාඩුව පවතින තනතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා නියමිත බඳවා ගැනීම් ක්‍රම අනුගමනය කරනු ලැබේ. එසේම ආයතනයේ කාර්යසාධනය ඉහල නැංවීම සඳහා මෙම පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

06.3 මානව සම්පත් සංවර්ධනය

ක්‍රීඩා සංවර්ධන නිලධාරීන්ගේ පුහුණු පාඨමාලා -2024							
අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය (විදේශීය/	නිමවුම/ලබාගත් දැනුම
				දේශීය (රු)	විදේශීය		
1	ප්‍රවාහන කළමනාකරණය	2	දින 01	14,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
2	Frist Olympic Solidarity Sport Administrators Course - 2024	4	දින 04	80,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
3	Two - day Workshop on Salary Conversions	3	දින 02	39,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
4	බඳවා ගැනීමේ පටිපාටිය	2	දින 02	26,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
5	Salary Conversions	1	දින 02	13,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
6	සංවර්ධන නිලධාරී සේවයේ I කාර්යක්ෂමතා කඩයිම් විභාගය සඳහා දැනුවත් කිරීමේ පුහුණුව	6	පැය 05	70,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
7	ස්ථාවර වත්කම් ලේඛනය සැකසීම හා පවත්වා ගෙන යාම	1	දින 01	7,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
8	703-0716 Seminar on Sports Training Management for Developing Countries - From 03 to 16 July 2024, in China	3	දින 13	-	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් ගෙවීම්කර ඇත.	විදේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
9	2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වැඩමුළුව	70	දින 01	තොරතුරු දැනගැනීමේ කොමිසන් සභාව විසින් ගෙවීම්කර ඇත	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.

ක්‍රීඩා සංවර්ධන නිලධාරීන්ගේ පුහුණු පාඨමාලා -2024							
අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමවුම/ලබාගත් දැනුම
				දේශීය (රු)	විදේශීය		
10	0821-0903 Seminar on Organizing Major Sports Events for Developing Countries - From 21 August to 03 September 2024, in China	1	දින 13	-	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් ගෙවීම්කර ඇත.	විදේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත
11	Fire and Rescue Skills Upgrading Training Program for Sri Lanka from 25th August to 01st September 2024	3	දින 07	අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ගෙවීම් කර ඇත.	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත
12	ආයතනික කළමනාකරණය ආයතන සංග්‍රහය හා පරිපාලන විධිවිධාන	3	දින 01	40,500.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත
13	2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වැඩමුළුව	100	දින 01	36,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත
14	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	6	දින 01	30,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත
15	වියදම් හා ගෙවීම් පටිපාටිය	3	දින 01	40,500.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබාඇත
16	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	4	දින 11	100,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබාඇත.
17	රියදුරන් සඳහා එක් දින වැඩමුළුව	2	දින 01	12,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබාඇත
18	රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටිය	5	දින 01	60,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබාඇත
19	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙනයාම	3	දින 01	15,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබාඇත

ක්‍රීඩා සංවර්ධන නිලධාරීන්ගේ පුහුණු පාඨමාලා -2024							
අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය (විදේශීය/	නිමවුම/ලබාගත් දැනුම
				දේශීය (රු)	විදේශීය		
20	කාර්යාල කාර්ය සහායකයින් සඳහා වැඩමුළුව	6	දින 02	78,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
21	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම	3	දින 01	15,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
22	Workshop on Advanced Excel - 2024	3	දින 02	49,500.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
23	Official Letter Writing in English	2	දින 01	14,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
24	භාෂා ප්‍රවීණතාවය යටතේ දෙමළ භාෂා පාඨමාලාව	35	පැය 100	75,000.00	_	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
25	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම	1	දින 01	5,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
26	Information Communication Technology	1	දින 02	13,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
27	ලේඛන අපහරණය පිළිබඳ පුහුණු වැඩමුළුව	1	දින 01	406,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
28	Procueent Guidelines, Planning & Regulation	1	දින 03	18,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
29	ක්‍රීඩා මනෝ විද්‍යා පාඨමාලාව	1	මාස 01	20,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
30	II කාර්යක්ෂමතා කඩයිම් විභාගය සඳහා පුහුණු වැඩමුළුව	8	දින 01	2,100.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.

❖ **ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

මෙහිදී නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වීමෙන් සේවක හැකියාවන් සෘජුවම වැඩි දියුණු වේ. හැකියාව වැඩිවන විට සේවකයාගේ ආත්මාභිමානය, ආත්ම විශ්වාසය හා සේවක තෘප්තිය වැඩි වන අතර, එමඟින් සේවක අභිප්‍රේරණය වැඩි වේ. එමෙන්ම මෙම සෑම ගුණාංගයන්ම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යඵලය ඉහළ යනු ඇත. මේ අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවය අනුව පුහුණු වැඩසටහන් ලබා දීම තුළින් ආයතනයේ කාර්යසාධනය ඉහළ ගොස් ඇත.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත්කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම (වාහන පිළිබඳ)	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ		නිවැරදි කාලවකවානු තුලදී අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කිරීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ (40)4 උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කලමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනයෙන් කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරීයෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල නොවේ	තාක්ෂණික ගැටළුවක් පවතී	දැනට ඇති නිල වෙබ් අඩවියේ පවතින තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් නව නිල වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		